Department of Education,Sabaragamuwa Province/ Weekly School

01) පාඩම හෝ ඒකකය - 6.1.6. පෙරියතම්බි සුබ්‍රමණියම් කලාකරුවාගේ නිර්මාණ අගයමු

02) ඉගෙනුම් ඵල -

- පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියාගේ සිතුවම් නිර්මාණ දක්නට ලැබෙන ස්ථාන හා එම සිතුවම් නම් කරයි.
- ඔහුගේ නිර්මාණ සඳහා බලපෑම් (ආභාස) ඇති කළ කරුණු විස්තර කරයි.
- ඔහු තම සිතුවම් සඳහා යොදාගත් වර්ණවල ස්වභාවය ගවේෂණය කරයි.
- පෙ. සුබ්‍රමණියම් ශිල්පියාගේ නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

03) ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

- පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ රැස් කරන්න.
- එම නිර්මාණවල පසුබිම පිළිබඳව අවබෝධයක් ලබා ගනිමින් සිතුවම්වල වස්තු විෂය, ආභාස, ශෛලිය හා ශිල්ප ක්‍රම පිළිබඳ විමසන්න.
- දේශීය චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අගය කිරීමේ වැදගත්කම පිළිබඳ අවබෝධ කර ගන්න.
- පහත ලබා දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කර ඒ ඇසුරෙන් කාර්ය පත්‍රිකාවේ ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- පාසල ආරම්භ වූ පසු ඔබගේ අනාවරණය පන්ති කාමරයේ ඉදිරිපත් කරන්න.

**<u>කාර්ය පත්‍රිකාව</u>**

01) පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

02) ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.

03) පහත සඳහන් කරුණු යටතේ තාවඩි මු. තුරෙයිසාමි ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

- තේමාව
- ශෛලිය
- අභාසය
- ශිල්ප ක්‍රමය
- කලා ලක්ෂණ

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- වෙනත් - (YouTube) - https://www.youtube.com/watch?v=CamETmy_HeQ
  https://www.youtube.com/watch?v=Rh4xaa5friE
  https://www.youtube.com/watch?v=ayP6lsUgGY0
- කියවීම් පත්‍රිකාව -

- දෙමළ ජනතාවගේ එදිනෙදා ජීවිත අවශ්‍යතාවන් සමග බැඳි අභිලාෂයන් ඉටු කළ චිත්‍ර ශිල්පියකු ලෙස පෙරියතම්බි සුබ්‍රමණියම් චිත්‍ර ශිල්පියාගේ නිර්මාණවලට සුවිශේෂී ස්ථානයක් හිමි වේ.
- ඔහු යාපනයේ ජීවත් වෙමින් ස්ව උත්සහයෙන් චිත්‍ර කලාව හැදෑරූ ශිල්පියෙකි.
- ඉන්දියානු කලාකරු රවි වර්මාගේ පුරාණ ඓතිහාසික සිද්ධි නිරූපිත සිතුවම්වල ශෛලිය ලක්ෂණ පෙ. සුබ්‍රමණියම්ගේ සිතුවම් සඳහා ද ආභාස වී ඇත.
- රවි වර්මාගේ සිතුවම්වල ශෛලිය සඳහා ඉන්දීය ජනප්‍රිය සංස්කෘතියේ ප්‍රකාශිත මාධ්‍ය වන චිත්‍රපට, කැලැන්ඩර් හා පෝස්ටර් චිත්‍ර ආදිය තුළින් නිරූපිත දේව රූප ලක්ෂණ පෙන්වන අතර එකී ලක්ෂණ පෙ. සුබ්‍රමණියම් ශිල්පියාගේ සිතුවම් ආශ්‍රිතව හඳුනාගත හැකි ය.
- රවි වර්මාගේ චිත්‍රවල දක්නට ලැබෙන දෘෂ්ටි මායා (ඡකකම්සදඛ දවඑසජ්ක* ප්‍රකාශන ශිල්ප ක්‍රමය පෙ. සුබ්‍රමණියම්ගේ නිර්මාණ සඳහා අනුගමනය කර ඇත.
- කෝවිල් බිත්ති චිත්‍රවලට අමතරව ඔහු තිර රෙදි චිත්‍ර නිර්මාණය කිරීම, විශාල ප්‍රමාණයේ බැනර් හා කට්ඖවුට් (ක්‍ඵඑදමඑ) චිත්‍ර නිර්මාණය කිරීම සඳහා දායක වූ ශිල්පියෙක් ද වෙයි.
- පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියාගේ සිතුවම් පහත සඳහන් කොවිල්වල බිත්ති මත හා තිර රෙදිවල දක්නට ලැබේ.
  - නල්ලූර් කෛලාසපිල්ලෙයාර් කෝවිල
  - ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිල
  - නල්ලූර් වීර කාලි අම්මන් කෝවිල

05) අතිරේක පොත්/සගරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- චිත්‍ර කලාව - රුවන්ති කුරේ
- පූජිත සිත්තරු - සොලමන් ප්‍රේමානන්ද

**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**